# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2024 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයට ලකුණු 25ක් වෙන් කර ඇති අතර එය අනු කොටස් 10 කින් සමන්විත වන අතර ප්‍රශ්න දහයෙන් 5ක් බහුවරණ ප්‍රශ්න වේ. පවතින විෂය නිර්දේශය යටතේ උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය ආවරණය වන පරිදි දැනුම පරීක්ෂා කර ඇත. බොහෝ අයදුම්කරුවන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අතර අයදුම්කරුවන් ඉතා සුළු පිරිසක් පමණක් ඉතා අඩු ලකුණු ලබාගෙන තිබුණි.

**1.1** මෙම ප්‍රශ්නය පිරිවැය ගිණුම්කරණය සහ තොග පිරිවැය සංකල්පය පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබූ අතර බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලබා දී තිබුණි. තොග පිරිවැයට අදාළව නිවැරදි උත්තරය හඳුනා ගැනීමට අයදුම්කරුවන් ඉතා සුළු පිරිසක් අසමත් වී ඇති බව දිස් විය.

**1.2** ලබා දී ඇති තොරතුරු මත පදනම්ව ලැයිස්තුගත සමාගමක හීන වන ශේෂ ක්‍රමය යොදාගෙන ක්ෂය වීම ගණනය කිරීමට මෙම ප්‍රශ්නයෙන් විමසන ලදී. බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා ඇති අතර උත්තර සැපයීමට අපොහොසත් වී ඇත්තේ ඉතා සුළු පිරිසක් පමණි. හීන වන ශේෂ ක්‍රමය යොදාගෙන ක්ෂය වීම ගණනය සඳහා නිවැරදි සූත්‍රය අයදුම්කරුවන් දැන නොසිටි බව දිස් විය.

**1.3** ප්‍රශ්නය මූල්‍ය ගිණුම්කරණයේ අනුකූලතාව පරීක්ෂා කරන ලදී. සාමාන්‍යයෙන්, අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ අදහස නිවැරදිව හඳුනාගෙන ඇති අතර, අනෙක් අය මෙම ප්‍රශ්නයට අපේක්ෂිත උත්තරය ලබා දීමට අපොහොසත් වී ඇත.

**1.4** මෙම ප්‍රශ්නය මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කළ දිනට පසුව දරණ ලද පාඩුව ඉදිරිපත් කරන්නේ කෙසේදැයි පරීක්ෂා කරන ලදී. සාමාන්‍යයෙන්, අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් මූල්‍ය ගිණුම්කරණයේ හෙළිදරව් කිරීමේ අදහස නිවැරදිව හඳුනාගෙන ඇති අතර, අනෙක් අය මෙම ප්‍රශ්නය සතුටුදායක ආකාරයකින් උත්තර සැපයීමට අපොහොසත් වී ඇත.

**1.5** පරීක්ෂක විසින් පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර ලාභය ගණනය කිරීමේ වෙනස පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, මෙම ක්ෂේත්‍රය පිළිබඳ දැනුම නොමැතිකම හේතුවෙන් බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තරය ලබා ගැනීමට අපොහොසත් විය.

**1.6** ප්‍රශ්නය මගින් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ විවිධ ක්‍රියාකාරකම් අතර පිරිවැය වෙන් කිරීමේ ක්‍රම සහ තනි නිෂ්පාදන මගින් එක් එක් ක්‍රියාකාරකම් භාවිතය මත පදනම්ව නිෂ්පාදන සඳහා පිරිවැය වෙන් කිරීමේ ක්‍රමය පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් සැපයූ උත්තර වැරදිය.

**1.7** හවුල්කරුවන්ට වේතන ගෙවීමට, හවුල්කාරිත්වයට අදාලව ප්‍රාග්ධනය හඳුන්වාදීම සහ නව හවුල්කරුවෙකු බඳවා ගැනීම සම්බන්ධ 1890 හි හවුල් ව්‍යාපාර ආඥාපනතේ විධිවිධාන සඳහන් කිරීමට අවශ්‍ය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදි උත්තර ලබා දී තිබුණි.

**1.8** මෙම ප්‍රශ්නය පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස සෘජුවම විමසා තිබුණි. බොහෝ අයදුම්කරුවන් සැපයූ උත්තර ප්‍රමාණවත් නොවූ අතර, ඔවුන්ට න්‍යායාත්මක කොටස පිළිබඳ අවබෝධයක් නොමැති බව හඳුනාගත හැකි විය.

**1.9** ණයකර පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී, ණයකරවල නිශ්චිත ලක්ෂණ ඇති බැවින්, නිවැරදි උත්තරය සපයා තිබුණේ සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවකි. මෙම මූලික ගිණුම්කරණ පද පිළිබඳව දැනුවත් වීම ඉතා වැදගත් වේ.

**1.10** මෙම ප්‍රශ්නය පුද්ගලික සීමිත සමාගමක එකතු කළ අගය මත බදු (VAT) පාලන ගිණුම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදිව උත්තර ලියා ඇති බව පෙන්නුම් විය. අඩු දෝෂ සහිතව VAT පාලන ගිණුම නිවැරදිව පිළියෙල කර ඇත්තේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය ස්කන්ධය ගණනය කිරීම සහ ලාභ අලාභ ගිණුම සකස් කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර දී සම්පූර්ණ ලකුණු ලබා ගත් අතර, සමහර අයදුම්කරුවන්ට න්‍යායාත්මක දැනුම නොමැතිකම හේතුවෙන් ලබා දී ඇති ගැලපීම් සිදුකර නොතිබුණි.

පහත සඳහන් හේතුන් නිසා සමහර අයදුම්කරුවන් හොඳින් මෙම ප්‍රශ්නයට උත්තර සපයා නොතිබුණිඃ

(1) ඔවුන් නිවැරදිව ක්ෂයවීම් ගණනය කර නොමැත.

(2) වියදම් වර්ගීකරණය පිළිබඳ දැනුම දුර්වල විය.

(3) උපචිත ගෙවීම් ගැලපීම් පිළිබඳ දැනුම මද බවක් දිස්විය.

(4) අවසන් තොග ගැලපීම් සඳහා නිසි අවධානයක් ලබා නොදීම.

(5) ආදායම් හඳුනාගැනීම පිළිබඳ අවබෝධයේ අඩු බවක් දිස්විය.

(6) ස්කන්ධය යනු කුමක්ද සහ ගණනය කරන්නේ කෙසේද? ස්කන්ධය සහ එහි ගණනය කිරීම් පිළිබඳ දැනුම නොමැතිකම.

(7) ඍජු වියදම් සහ වක්‍ර වියදම් අතර වෙනස පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම.

(8) වැරදි ලෙස අත්තිකාරම් ගෙවීම් ගැලපීම.

(9) ලාභය නිසි ලෙස භාවිත කර නොතිබුණි.

(10) ප්‍රශ්නයට අදාල නොවන මුදල් පොත සකස් කිරීමට ඇතැමුන් සැලකිය යුතු කාලයක් වැය කර තිබුණි.

(11) ලාභ සහ අලාභ ඇතුළත් කිරීම් වෙළෙඳ ගිණුමට ඇතුළත් කර ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය ලාභ හෝ අලාභ විසර්ජන ගිණුම සහ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම සකස් කරන්නේ කෙසේද යන්න පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

පහත සඳහන් හේතුන් නිසා සමහර අයදුම්කරුවන් හොඳින් උත්තර සපයා නොතිබුණිඃ

(1) විසර්ජන ගිණුමට සහ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වලට අදාළ ගනුදෙනු පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොතිබුණි.

(2) හවුල්කාරිත්ව නීති පිළිබඳ දැනුම නොමැතිකම.

(3) හවුල්කරුගේ වාර්ෂික වැටුප වෙනුවට මාසික වැටුප සැලකිල්ලට ගැනීම.

(4) අයදුම්කරුවන් විසින් ජංගම ගිණුම්වල ගොඩනැගිලි කුලිය සහ ණය පොලී සමහර සලකා බලා නොතිබුණි.

(5) ඇතැමුන් ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් ජංගම ගිණුම් සඳහා ද ගලපා ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

"ලාභ නොලබන" සංවිධානයක සාමාජික ගාස්තු දායකත්ව ගිණුම සහ ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම විභාග පරීක්ෂකවරයා විසින් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර ඇති අතර පහත සඳහන් හේතූන් මත සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණිඃ

(1) අයදුම්කරුවන්ට මෙම ගිණුම පිළිබඳව අඩු දැනුමක් තිබූ අතර ඔවුන් ප්‍රශ්නයෙන් ගනුදෙනු හඳුනාගෙන නොමැත.

(2) අයදුම්කරුවන් සාමාජික ගිණුමට ද්විත්ව සටහන් ඇතුළත් කර නොතිබුණි.

(3) සාමාජික ගාස්තු ගිණුමේ අදාළ ආරම්භක සහ අවසන් ශේෂය කුමන පැත්තකින් සටහන් කළ යුතුද යන්න පිළිබඳව සමහර අයදුම්කරුවන්ට අදහසක් නොතිබූ අතර, සමහර අයදුම්කරුවන් සාමාජික ගාස්තු ගණනය කරන්නේ කෙසේදැයි හඳුනාගෙන නොතිබුණි.

(4) අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව කියවා නොතිබුණි, උදාහරණයක් ලෙස, ඔවුන් වියදම් සඳහා නිවැරදි ප්‍රතිශත භාවිත කර නොමැත.

(5) අයදුම්කරුවන් ප්‍රදර්ශන ආදායම සහ ප්‍රධාන ගිණුම් නිසි ලෙස ඉදිරිපත් කර නොමැත.

(6) අයදුම්කරුවන් ආදායම් සහ වියදම් වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## ප්‍රශ්න අංක 05

ලබා දී ඇති දත්ත මත පදනම්ව, දී ඇති කාර්යයක් සඳහා අය කළ යුතු මිල ගණනය කිරීම හා තොග පාලන ගිණුම් පිළියෙල කිරීම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ කර ඇති නමුත් ප්‍රශ්නයට වෙන් කර ඇති සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු ප්‍රමාණයකි.

අයදුම්කරුවන් විසින් සිදුකරන ලද පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය කරන ලදීඃ

(1) බොහෝ අයදුම්කරුවන්ට නිෂ්පාදන ක්‍රියාවලියේ අදියර හඳුනා ගැනීමට නොහැකි විය

(2) තොග සම්බන්ධ ලෙජර් ගනුදෙනු නිසි ලෙස සටහන් කර නොතිබුණි.

(3) අයදුම්කරුවන් ගිණුම් අතර ගනුදෙනු නිසි ලෙස සටහන් කර නොතිබුණි. උදාහරණයක් ලෙස, අමු ද්‍රව්‍ය පාලන ගිණුමේ සිට නොනිමි වැඩ පාලන ගිණුම අතර ගනුදෙනු.

(4) බොහෝ අයදුම්කරුවන්ට ලාභාන්තිකය ගණනය කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් නිවැරදි අනුපාතය භාවිත කර සෘජු ශ්‍රම පිරිවැය ගණනය කර නොමැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය **(A)** සහ **(B)** යන කොටස් දෙකකින් සමන්විත වේ.

**(A) කොටස** ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කිරීම සහ ලබා දී ඇති තොරතුරු මත පදනම්ව යම් නිෂ්පාදනයක් සඳහා ඇණවුම් කළ යුතු ප්‍රශස්ත ඇණවුම් ගණන පරීක්ෂා කරන ලදී.

(1) බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත් අතර සමහර අයදුම්කරුවන් නිවැරදි සූත්‍රය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම හේතුවෙන් ලකුණු ලබා ගැනීමට අසමත් විය.

(2) සමහර අයදුම්කරුවන් ඇණවුම් නිවැරදි සූත්‍රයට දත්ත වැරදි ලෙස ආදේශ කර තිබුණි.

(3) බොහෝ අයදුම්කරුවන් ඇණවුම් කල යුතු ප්‍රශස්ත ඇණවුම් සංඛ්‍යාව ගණනය කරන්නේ කෙසේදැයි දැන සිටියේ නැත.

**(B) කොටස** සේවකයෙකුගේ වැටුප් ගණනය කිරීම පරීක්ෂා කරන ලදී.

(1) බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. අයදුම්කරුවන් කිහිප දෙනෙකු ප්‍රසාද අනුපාතය නිවැරදිව ගණනය කළද, ඔවුන් ඉතිරි කර ඇති මුළු කාලය සඳහා ප්‍රසාද දීමනාව ගණනය නොකර සතිපතා වැටුපට ප්‍රසාද අනුපාතය එකතු කර ඇත.

(2) සමහර අයදුම්කරුවන් ඉතිරි කළ කාලය ගණනය කරන්නේ කෙසේදැයි දැන සිටියේ නැත.

(3) **A** සහ **B** යන කොටස් දෙකෙහිම ගණිතමය දෝෂ දක්නට ලැබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක නොවීය.**

# <u>C කොටස</u>

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය පුද්ගලික සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පරීක්ෂා කරන ලද අතර **(a)** සහ **(b)** ලෙස කොටස් 2 කින් සමන්විත විය. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කර ඇති අතර **(b) කොටස** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කර ඇත. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර ඇති අතර, ඔවුන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

පහත දුර්වලතා නිරීක්ෂණය විය:

**විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) බොහෝ අයදුම්කරුවන් තොග අලාභ සඳහා වෙළෙඳ ගිණුමේ නිසි ලෙස ගැලපීම සිදු කර නොතිබුණි.

(2) මෝටර් රථ ඉවත් කිරීම සම්බන්ධයෙන් ක්ෂයවීම් නිසිලෙස සිදුකර නොමැති හෙයින් ක්ෂයවීම් සඳහා ගිණුම් සටහන් නිසි ලෙස ගණනය කර නොතිබුණි.

(3) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ කුලී ගැලපීම නිවැරදිව සිදු කර නොතිබුණි.

(4) ශේෂ පිරික්සුමේ හර සහ බැර ශේෂයන් පිළිබඳව අයදුම්කරුවන්ට නිසි දැනුමක් නොතිබුණි.

(5) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ජල හා විදුලි ගිණුම් නිවැරදිව සකස් කර නොතිබුණි. එයට හේතුව අයදුම්කරුවන් උපචිත විදුලිය නිසි ලෙස ගලපා නොතිබීමයි.

(6) සමහර අයදුම්කරුවන් විසින් ආදායම් බදු ගැලපීම් නිවැරදිව සිදු කර නොතිබුණි.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) බොහෝ අයදුම්කරුවන් මෝටර් රථවල පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් නිවැරදිව ගණනය කර නොතිබුණි. එබැවින්, මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ද ධාරණ අගයයන් නිවැරදි නොවිය.

(2) සමහර අයදුම්කරුවන් වෙළෙඳ ලැබිය යුතු ශේෂය නිවැරදිව ගලපා නොතිබුණි. එයට හේතුව ඔවුන් වෙළඳ ලැබිය යුතු ගිණුමේ ඇති අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන නිසි ලෙස ගලපා නොතිබීමයි.

(3) සමහර අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නිවැරදිව ගලපා නොතිබුණි.

**වෙනත් අදහස්:**

(1) අයදුම්කරුවන් විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා නිවැරදි ආකෘති පිළියෙල කළ යුතුය.

(2) විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් සහ පරිපාලන වියදම් යටතේ සිදු කළ යුතු අදාළ වියදම් අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගත යුතුය.

(3) විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීමෙන් පසු සමහර අයදුම්කරුවන් බදු ගෙවීමට පෙර ලාභය ගැනීමේදී අඩු කර ඇති වියදම් ලැයිස්තුව සඳහා වෙනත් සටහනක් සකස් කර ඇති අතර ඒ සඳහා අනවශ්‍ය ලෙස කාලය ගත කර ඇත.

(4) අයදුම්කරුවන් පිළිතුර සඳහා ඔවුන්ගේ පෙරවැඩ නිවැරදි ස්ථානයේ ඉදිරිපත් කර නොමැති අතර ඔවුන් එය විවිධ ස්ථානවලට අමුණා ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

\- * * * -